# 7 සසුන රැකුමෙහි පළමු පියවර

එදා සම්බුද්ධ ජයන්ති විද්‍යාලයට ඉතා වැදගත් දිනයකි. පිරිවෙන්වලට සහ පාසල්වලට නොමිලේ ලබාදීම සඳහා ආචාර්ය බෝදාගම චන්දිම ස්වාමීන් වහන්සේ විසින් නැවත මුද්‍රණය කරවන ලද සම්පූර්ණ ත්‍රිපිටකය විද්‍යාලයීය පුස්තකාලයට ලැබීම ඊට හේතුවයි. ත්‍රිපිටක පොත් දකුම්කලු පෙරහරකින් විද්‍යාලයට වැඩම කර ඒ වෙනුවෙන් ම පිළියෙල කර තිබුණු විශේෂ අල්මාරියක තැන්පත් කැරිණි. මූලික උත්සවයෙන් පසු ව ධර්මානුශාසනාවක් හා ධර්ම සාකච්ඡාවක් ද පැවතිණි. ධර්ම දේශක ස්වාමීන් වහන්සේ දේශනාව නිමා කර, "මේ දරුවන්ට මගේ දහම් දෙසුම ඇසුරෙන් තව දුරටත් යමක් දැන ගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා අවස්ථාව ලබා දෙනවා" යි පැවසූහ.

**සංගායනා යනු කුමක් ද?**

පළමුව නැගී සිටියේ බුදුදහමට විශේෂ ලැදියාවක් ඇති ධම්මිකා ශිෂ්‍යාව ය. "අවසරයි ගරුතර ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේගේ ධර්ම දේශනාවේ දී කීප වරක් ම සඳහන් වුණා සංගායනා කියන වචනය. මා දැනගන්න කැමතියි, සංගායනා කියන වචනයේ තේරුම, සංගායනාවක් කියන්නේ කුමක් ද කියලා. මා ගෞරවයෙන් ආරාධනා කරනවා ඒක පැහැදිලි කර දෙන ලෙස."

ප්‍රශ්නය විමසූ ශිෂ්‍යාවට ප්‍රශංසා කළ ස්වාමීන් වහන්සේ මෙසේ පැවසූහ. "එක් ව ගායනා කිරීම, එක් ව සජ්ඣායනා කිරීම, සාමූහික ව කියවීම යන්න සංගායනා යන වචනයෙන් කියැවෙනවා. පාලි පොත්වල ඒක සඳහන් වන්නේ සංගීති කියලයි."

**සාමූහික ව කියවීම, එක් ව ගායනා කිරීම, එක් ව සජ්ඣායනා කිරීම සංගායනාවයි.**

අපේ සංගීතිවල දී කෙරුණේ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මයත් පනවන ලද විනයත් ස්වාමීන් වහන්සේලා එක් රැස් ව සාකච්ඡා

කිරීමයි. එසේ සාකච්ඡා කර තමයි 'මේ අපේ බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්ම විනය' කියා පොදු එකඟතාවකට පැමිණියේ. එසේ එකඟත්වයකට පැමිණීමේ අවශ්‍යතාව පැන නැගුණු අවස්ථා කීපයක් ම ශාසන ඉතිහාසයේ තිබෙනවා.

'අවසරයි ස්වාමීන් වහන්ස, මා දැනගන්න කැමැතියි ඒ ආකාරයට සංගායනා කරන්න කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තිබුණා ද කියා.' ඒ ප්‍රශ්නය මතු කළේ විමර්ශන ශිෂ්‍යයායි. ඔව් දරුවනේ, එහෙම වදාළ අවස්ථා තිබෙනවා. ඔබ අසා ඇති නේ බුද්ධ කාලයේ සිටි නිගණ්ඨ නාතපුත්ත යන ශාස්තෘතුමන් ගැන. ඒ ජෛන ආගමේ ප්‍රධානියා නේ. එතුමාගේ අභාවයත් සමඟ ම එම ශ්‍රාවකයන් අතර මතභේද වාද විවාද ඇති වුණා. ඒ නිසා ම ඒ අය අතර අසමගිය වැඩි වුණා. එයට හේතු වුණේ තම ශාස්තෘවරයා ඉගැන්වූ දහම හැටියට එක් එක් ශ්‍රාවකයා අතර විවිධ මත පැවතීමයි. බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු ව එබඳු තත්ත්වයක් ඇති නො වේවා යන ප්‍රාර්ථනාව එදා භික්ෂූන් වහන්සේ අතර පැවතුණා. එය දැනගත් බුදුරජාණන් වහන්සේ වදාළා සියලු ම ශ්‍රාවක ශ්‍රාවිකාවන්ට තමන් වහන්සේ දේශනා කර තිබෙන්නේ එක ම දහමක් නිසා ජෛන ආගමේ ඇති වූ තත්ත්වය බුදුසසුනේ ඇති වීමට ඉඩක් නොමැති බව. කවර හෝ ගැටලුවක් මතුවුව හොත් වාද විවාද නො කර සංගායනා කිරීමයි කළ යුත්තේ කියා බුදුරජාණන් වහන්සේ එදා දේශනා කළා.

ඊළඟ ප්‍රශ්නය මතු කළේ විද්‍යාලයේ ප්‍රධාන ශිෂ්‍ය නායිකාවයි. 'බුද්ධ පරිනිර්වාණයෙන් පසු ව ගැටලු මතු වුවහොත් ඒවා නිරාකරණය කිරීම සඳහා නායක හාමුදුරුනමක් බුදුරජාණන් වහන්සේ විසින් පත්කරනු ලැබ සිටියේ නැද්ද' යන්න ඇයගේ ප්‍රශ්නයයි. "නෑ, එහෙම පත් කළේ නෑ. පරිනිර්වාණයෙන් පසු ධර්ම විනය ශාස්තෘවරයා ලෙස සලකන්න කියලයි උන්වහන්සේ වදාළේ. ඒ නිසා ම තමයි සංගායනා කර මතභේද නැතුව ධර්ම විනය පිළිබඳ පොදු එකඟතාවක් ඇතිකරගත යුත්තේ." ඒ ස්වාමීන් වහන්සේගේ කෙටි පිළිතුරයි.

'අපේ හාමුදුරුවනේ, ධර්ම දේශනාවෙහි දී පැහැදිලි වුණා අද අප වැඩමවා ගත් ත්‍රිපිටකය ඒ ආකාරයෙන් සකස් වීමට පදනම වැටුණේ පළමු සංගායනාවේ දී කියල. ඒ සංගායනාව පැවැත්වූයේත් ස්වාමීන් වහන්සේලා අතර මතභේදයක් ඇතිවෙලා ද කියලා මා දැන ගන්න කැමතියි.' එසේ ප්‍රශ්න කළේ හත්වන ශ්‍රේණියේ උද්‍යෝග ශිෂ්‍යයායි. 'ඒක මේ දරුවන් දැනගන්න ම ඕනෑ. මම ටිකක් විස්තර ඇති ව කියා දෙන්නම්.' ස්වාමීන් වහන්සේ පිළිතුරු දීම ආරම්භ කළා.

## පළමු සංගායනාවේ පසුබිම



7.1 රූපය

'ඔය දරුවෝ අසා ඇතිනේ මහාකාශ්‍යප මහ රහතන් වහන්සේ ගැන. උන් වහන්සේ තවත් භික්ෂු පිරිසක් සමග පාවා නුවර සිට කුසිනාරා නුවර පැත්තට වඩිමින් සිටියා. අතරමග දී හමුවුණා කුසිනාරාවේ සිට පැමිණෙන ආජීවක නමින් හැඳින්වෙන අන්‍යාගමික පැවිද්දකු. කාශ්‍යප මහ රහතන් වහන්සේ අර ආජීවකයාගෙන් බුදුරජාණන් වහන්සේ ගැන තොරතුරු ඇසුවා. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා අදට සතියක් පමණ වෙනවා. දැන් ආදාහන කටයුතු පිළියෙල වෙනවා කියා ඔහු කීවා. ඒ වෙලාවේ එහි සිටි සාමාන්‍ය හාමුදුරුවන් හඬන්නට වැලපෙන්නට පටන් ගත්තා. රහතන් වහන්සේලා නම් හැඬුවේ නෑ. උන්වහන්සේ දන්නවා බුදු හාමුදුරුවන්ට වුනත් හැමදා ම වැඩහිටින්නට බැරි බව. එතැන සිටියා මහලු කාලේ පැවිදි වූ භික්ෂු නමක් සුභද්‍ර කියලා. ඒ භික්ෂු නම පුදුම ප්‍රකාශයක් කළා.'

"ඇවැත්නි, ශෝක නො කරන්න. නො වැලපෙන්න. අප දැන් ඒ මහා ශ්‍රමණයන් වහන්සේගෙන් නිදහස් වුණා. උන්වහන්සේ ජීවත් ව සිටිය දී මේවා කැපයි, මේවා අකැපයි, මේවා කරන්න, මේවා නො කරන්න කියා අපට නීති පැනෙව්වා. දැන් අපි නිදහස්. නීති පනවන්න කෙනෙක් නෑ. අපට කැමැති දෙයක් කරමු. අකැමැති දෙයක් නො කරමු"

මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ශෝකවන, වැලපෙන භික්ෂූන්ගේ සිත සැනසෙන ලෙස අනුශාසනාවක් කළා. සුභද්‍ර භික්ෂුවගේ ප්‍රකාශය කෙරෙහි බලවත් සංවේගයෙන් යුතු ව විශේෂ අවධානයක් යොමු කළා. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී දේහය ආදාහනය කිරීමෙන් පසු ව උන්වහන්සේ කල්පනා කළේ එබඳු අසංවර, අත්තනෝමතික ප්‍රකාශ කරන භික්ෂූන් නිසා ශාසනයට සිදුවිය හැකි හානිය ගැනයි. නිල වශයෙන් වගකීමක් පැවරී නො තිබුණත් එබඳු අවස්ථාවක ශාසනය වෙනුවෙන් ඉදිරිපත් වීම තම යුතුකමක් ලෙස උන්වහන්සේ කල්පනා කළා. සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් සපිරෙන වෙලාවේ සංගායනාවක් කිරීමට අවශ්‍ය සියලු කටයුතු සංවිධානය කළා. සුභද්‍ර භික්ෂුවගේ අයහපත් ප්‍රකාශය පළමු සංගායනාවට ආසන්න ම හේතුව ලෙසයි සැලකෙන්නේ.

'ස්වාමීන් වහන්ස, ආසන්න ම හේතු ව ඒ ප්‍රකාශය කියා කීවා ම මට හිතෙන්නේ තවත් හේතු තියෙන්නට ඇති කියල යි.' ඒ විමසීම කළේ තුලන ශිෂ්‍යයායි.

## සංගායනාවට හේතු

'ඔව් ඒක හරි, තවත් හේතු තිබුණ බව පෙනෙනවා. අර ජෛන ශාසනයේ ඇති වුණු මතභේද වගේ මතභේද ඇති වීම වළක්වා ගැනීමටත් අවශ්‍ය වෙන්නට ඇති නේ. අනෙක බුදුරදුන් ජීවමාන සමයෙහි ම සිටියානෙ ධර්මය ගැන වැරැදි වැටහීම් ඇති කරගත් භික්ෂූන් වහන්සේලා. එබඳු අයගෙන් ධර්මය විකෘති වීමට ඇති ඉඩ ඇහිරීමත් එකක්. බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්ම විනය එක්තැන් කර බුද්ධ වචනය නම් මෙයයි යනුවෙන් පොදු එකඟතාවක් ඇතුව ඉදිරියට පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාවත් තිබුණා. බුද්ධ පරිනිර්වාණයෙන් පසු ව ශාස්තෘවරයා වුණේ බුද්ධ වචනය හෙවත් ධර්ම, විනය දෙකනේ.' ස්වාමීන් වහන්සේ එසේ පිළිතුරු දුන්නා.

ගවේෂිකා ශිෂ්‍යාවට ද ප්‍රශ්නයක් විය. ඇය විමසුවේ බුද්දානුබුද්දක ශික්ෂාපද පිළිබඳ තීරණයක් ගැනීමේ අවශ්‍යතාවත් මේ සංගායනාව පැවැත්වීමට හේතු වූයේ ද යන්නයි. ඊට පිළිතුරු වශයෙන් ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කළේ සංගායනාව පැවැත්වීමට එය හේතුවක් නො වූවත් ධර්ම විනය සංගායනාවෙන් පසුව ඒ කාරණයත් සාකච්ඡාවට භාජන වූ බවයි.

'ස්වාමීන් වහන්ස, බුද්දානුබුද්දක ශික්ෂාපද පිළිබඳ අප දන්නේ නෑ. කරුණා කරල එය පැහැදිලි කර දෙනවා ද?' එසේ විමසූවේ විමංශිකා

ශිෂ්‍යාවයි. ස්වාමීන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ. 'බුද්ධ පරිනිර්වාණයෙන් පසු ව සංඝයා කැමැති නම් බුද්දානුබුද්දක ශික්‍ෂාපද ඉවත් කළාට වරදක් නැතැයි බුදුරජාණන් වහන්සේ ආනන්ද තෙරනුවන්ට දේශනා කර තිබුණා. එහෙත් ඒ ශික්ෂාපද මොනවා දැයි සංගායනාවට සහභාගි වූ ස්වාමීන් වහන්සේ අතර එක අදහසක් තිබුණේ නැහැ. අනෙක් කරුණ බුද්ධ පරිනිර්වාණයත් සමඟ ම කුමන හෝ ශික්ෂාපදයක් ඉවත් කිරීම සුදුසු නො වන බවයි මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ අදහස වූයේ. ඒ නිසා ම ශාසනික වශයෙන් ඉතා වැදගත් පහත සඳහන් තීරණයට පැමිණියා.'

**නො පැන වූ දෙයක් නො පනවමු. පනවා ඇති දේ උල්ලංඝනය නො කරමු. පනවා ඇති ශික්ෂාපද සමාදන් ව ඒවාට අනුව හික්මෙමු.**

## සංගායනාවේ දී කළ දේ

"අවසරයි ස්වාමීන් වහන්ස, සංගායනාවේ දී ප්‍රධාන වශයෙන් සිදු වූයේ කුමක් ද කියලා පැහැදිලි කර දෙනවා ද?" ඒ බුද්ධික ශිෂ්‍යයාගේ ප්‍රශ්නයයි. දරුවනි, සංගායනාවේ දී කළේ ප්‍රධාන වශයෙන් ම ධර්ම, විනය දෙක පිළිබඳ සාකච්ඡා කර එකඟතාවකට පැමිණීමයි. විනය, ශාසනයේ ජීවය ලෙස සලකා පළමුවෙන් විනය සංගායනා කළා. එක් එක් ශික්ෂාපදය ඉදිරිපත් කර එය පැනවූයේ කොහේ දී ද? කවුරුන් නිසා ද? ආදි වශයෙන් **මහාකාශ්‍යප** මහරහතන් වහන්සේ ප්‍රශ්න කළා. පිළිතුරු දුන්නේ විනයධර භික්ෂූන්ගෙන් අග්‍ර වූ **උපාලි** මහරහතන් වහන්සේයි.

එයින් ගොනු කර ගත් විනය කරුණු සියල්ල සම්මත කරගත් පසු ව ධර්මය සංගායනා කළා. මහාකාශ්‍යප මහරහතන් වහන්සේ විමසූ ප්‍රශ්නවලට පිළිතුරු සැපයුවේ ධර්ම භාණ්ඩාගාරික ආනන්ද මහරහතන් වහන්සේයි. අවසානයේ සංගායනාවට සහභාගි වූ සියලු ම තෙරවරුන් එකඟතාවකට පත්වුණා ධර්ම විනය දෙකෙහි අන්තර්ගත කරුණු පිළිබඳ ව. එය බුද්ධ වචනය ලෙස පිළිගැනීමටත් එය වෙනස් නො කිරීමටත් අලුත් දේ එකතු නො කිරීමටත් තීරණය කර ගත්තා.

'ස්වාමීන් වහන්ස, ඔය සංගායනාවට සහභාගී වුණේ මහා කාශ්‍යප, උපාලි, ආනන්ද යන මහරහතන් වහන්සේලා පමණක් ද?' තවත් ශිෂ්‍යාවක් එසේ ප්‍රශ්න කළා. ස්වාමීන් වහන්සේගෙන් ලැබුණ පිළිතුර මෙසේයි.

'ඒ තුන් නම ඇතුළු රහතන් වහන්සේලා පන්සිය නමක් සහභාගි වුණා. එනිසා ම **පංචසතිකා සංගීති** කියලා මේ සංගායනවා හැඳින්වෙනවා. සංගායනාවට ප්‍රධාන හේතුව වූ සුභද්‍ර භික්ෂුනමගේ ප්‍රකාශය විනයට අදාළ වූවක් නිසාත් පළමු ව විනය සංගායනා කළ නිසාත් **විනය සංගීති** කියලත් මේ සංගායනාව හැඳින්වෙනවා. සංගායනාවේ ප්‍රධානත්වය ඉසිලූයේ මහා කාශ්‍යප මහරහතන් වහන්සේයි.'

'ස්වාමීන් වහන්ස, සංගායනාවට භික්ෂුණී, උපාසක, උපාසිකා පිරිස සහභාගි වුණේ නැද් ද' යි ප්‍රශ්න කළේ ප්‍රබුද්ධ ශිෂ්‍යයායි. 'එම පිරිස සහභාගි වුණේ නෑ. උපාසක පිරිසට අයත් **අජාසත්ත** රජතුමා සම්පූර්ණ අනුග්‍රහය දැක්වූවා. ඒ නිසා පළමු සංගායනාවේ දායකයා, අනුග්‍රාහකයා හැටියට සැලකෙන්නේ අජාසත්ත රජතුමායි.' ස්වාමීන් වහන්සේ පැහැදිලි කළා.

'ගරු ස්වාමීන් වහන්ස, සංගායනාව පැවැත්වූයේ කුමන ස්ථානයක ද, බුද්ධ පරිනිර්වාණයෙන් කොපමණ කාලයකට පසු ද, කොපමණ කාලයක් ඒ සඳහා ගතවුණා ද කියන කරුණුත් දැන ගන්නට තිබෙනවා නම් හොඳයි' කියා විමසුවේ සාරාංගිකා ශිෂ්‍යාවයි. බුද්ධ පරිනිර්වාණයෙන් මාස තුනකට පසුව රජගහ නුවර වේභාර පර්වත ප්‍රාන්තයෙහි පිහිටි සප්තපර්ණි නම් ගල්ගුහා ද්වාරයේ දී පැවැත් වූ බවත් ඒ සඳහා මාස හතක් ගත වූ බවත් ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කළහ.

'අපේ හාමුදුරුවනේ, අද අප වැඩමවා ගත් ත්‍රිපිටක පොත් වහන්සේලා සියල්ල ම දැනට තිබෙන ආකාරයෙන් සකස් වුණේ පළමු සංගායනාවේ දී කියලා මා අසා තිබෙනවා. ඒක හරි ද අපේ හාමුදුරුවනේ,' ඒ ප්‍රශ්නය ඇසුවේ විමර්ශන ශිෂ්‍යයායි. පිටක වශයෙන් සකස් වීම ආරම්භ වුණේ පළමු සංගායනාවේ දී තමයි. දෙවන, තෙවන සංගායනාවල දීත් සංගායනා වෙලා තමයි සම්පූර්ණයෙන් ම සකස් වුණේ. හැබැයි ඉතා ම වැදගත් දෙයක් පළමු සංගායනාවෙ දී සිද්ධ වුණා. ඒ තමයි ඒ ඒ කොටස් කට පාඩමින් පවත්වාගෙන යාම සඳහා ප්‍රධාන තෙරුන් වහන්සේලාට හා උන්වහන්සේලාගේ ශිෂ්‍ය පරම්පරාවලට පැවරීම.

**භාණක පරම්පරා ඇතිවීම**

| | | |
|---|---|---|
| විනය | - | උපාලි තෙරුන්ට හා උන්වහන්සේගේ ශිෂ්‍ය පරම්පරාවට |
| දීඝ නිකාය | - | ආනන්ද තෙරුන් ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට |
| මජ්ඣිම නිකාය | - | සැරියුත් තෙරණුවන්ගේ ශිෂ්‍ය පරම්පරාවට |
| සංයුක්ත නිකාය | - | මහාකාශ්‍යප තෙරුන් ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට |
| අංගුත්තර නිකාය | - | අනුරුද්ධ තෙරුන් ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට |
| ඛුද්දක නිකාය | - | සියලු ම භික්ෂූන් වහන්සේලාට |

පසුකාලීන ව ඒ භික්ෂු පිරිස දීඝ භාණක, මජ්ඣිම භාණක ආදී වශයෙන් හැඳින්වුණු නිසා භාණක පරම්පරා ඇති වූ බව ද ස්වාමීන් වහන්සේ සඳහන් කළා.

මේ සංගායනාව ආශ්‍රිත ව සාකච්ඡා කළ යුතු තවත් කරුණු ඇතත් පෙරහැරේ ගමන් කිරීමෙන් හා බොහෝ වේලාවක් ඒකාකාරී ව වාඩිවී සිටීමෙන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙහෙස වී ඇතැයි සැලකූ ස්වාමීන් වහන්සේ සාකච්ඡාවේ සාරාංශයක් ඉදිරිපත් කරමින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ක්‍රියාකාරී ව සහභාගි වීම ගැන බොහෝ ප්‍රශංසා කළහ.

**සාරාංශය**

- බුද්ධ පරිනිර්වාණයෙන් පසු ව අපේ ශාස්තෘවරයා ධර්ම, විනය දෙකයි.
- ගැටලු ඇති වුවහොත් වාද විවාද නො කර ධර්මවිනය සංගායනා කරන්නැයි බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත.
- පළමු සංගායනාවට ආසන්න හේතුව සුභද්‍ර භික්ෂු නමගේ අයහපත් වචනයි.
- මෙම සංගායනාවේ ප්‍රධානත්වය මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ඉසිලූ අතර ධර්ම විනය පිළිබඳ අවශ්‍ය සියලු කරුණු පැහැදිලි කරමින් උපාලි රහතන් වහන්සේ, ආනන්ද රහතන් වහන්සේ විශේෂ කාර්ය භාරයක් ඉටු කළහ.

- සංගායනාවට රහතන් වහන්සේ 500 ක් සහභාගි වූ නිසා පංචසතිකා නමින් හැඳින් වේ.
- බුද්ධ පරිනිර්වාණයෙන් මාස තුනකට පසු ව රජගහ නුවර වේභාර පර්වත ප්‍රාන්තයේ සප්තපර්ණි ගල් ගුහා ද්වාරයේ පැවති මෙම සංගායනාවට මාස හතක් ගත විය.
- ප්‍රධාන අනුග්‍රාහකයා වූයේ මගධාධිපති අජාසත්ත රජතුමායි.
- බුදුරදුන් පැන වූ කිසිදු ශික්ෂාපදයක් ඉවත් නො කිරීමටත් නො පැනවූවක් නො පැනවීමටත් මෙම සංගායනාවේ දී තීරණය කෙරිණි.
- සංගායනාව අවසානයේ එක් එක් කොටස් කටපාඩමින් පවත්වා ගෙන යෑම සඳහා භික්ෂු පරම්පරාවලට පැවරිණි. ඒවා භාණක පරම්පරා ලෙස පසු ව හැඳින්විණි.

**ක්‍රියාකාරකම**

1. පළමු සංගායනාව පිළිබඳ මූලික කරුණු ඇතුළත් වන සේ කෙටි විස්තරයක් ලියන්න.
2. සුභද්‍ර භික්ෂු නමගේ ප්‍රකාශය පදනම් කරගෙන මහාකාශ්‍යප මහ රහතන් වහන්සේ ගත් ක්‍රියාමාර්ගය ඔබ අගය කරමින් වාක්‍යය හතරක් ලියන්න.
3. පළමු සංගායනාවේ තොරතුරු පදනම් කරගෙන ඔබේ ජීවිතයට ලබා ගත හැකි ආදර්ශ ලැයිස්තුගත කරන්න.

**පැවරුම**

ත්‍රිපිටකයට අයත් ග්‍රන්ථ වෙන වෙන ම හඳුනාගත හැකි වන සේ වගුවක් පිළියෙල කරන්න.


නොමිලේ බෙදාහැරීම පිණිසයි.